ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2014 මැයි මස 20 වැනි දින |

## මුදල් ප්‍රතිපත්ති විවරණය - 2014 මැයි

2012 දෙසැම්බර් මස සිට මහ බැංකුව සිය ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික එනම් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR), නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පිළිවෙලින් පදනම් අංක 125 කින් සහ පදනම් අංක 175 කින් අඩු කිරීම සහ වාණිජ බැංකුවල රුපියල් තැන්පතු වගකීම් මත වූ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව (SRR) මෙම කාල පරිච්ඡේදය තුළ ප්‍රතිශතාංක 2 කින් අඩු කිරීම මගින් මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කරන ලදී. ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට ප්‍රතිචාර දක්වමින් වෙළෙඳපොළ ණය සහ තැන්පතු පොලී අනුපාතික සැලකිය යුතු ලෙස පහළට නැඹුරු වුවත් දිගුකාලීන ණය අනුපාතිකයන් තවදුරටත් පහළ බැසීමේ අවකාශයක් පවතී.

වර්තමාන මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පවත්වාගෙන යාම සඳහා දායක වන මූලික සාධක වන පහළ උද්ධමනය සහ හිතකර උද්ධමන අපේක්ෂාවන් අඛණ්ඩවම හිතකර අයුරින් පවතී. 2014 අප්‍රේල් මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මතුපිට උද්ධමනය සියයට 4.9 ක් ලෙස එහි අපේක්ෂිත පරාසය තුළ පැවති අතර වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය සියයට 3.4 ක මට්ටමේ නොවෙනස්ව පැවතුණි. කාලගුණය හා සම්බන්ධ සැපයුම් අවහිරතාවයන් හේතුවෙන් සමහර ආහාර මිල ගණන්වල හැසිරීමේ සුළු විචලනයන් ඇතිවිය හැකි වුවද, හිතකර උද්ධමන අපේක්ෂාවන් හේතුවෙන් ඉදිරි මාස කිහිපයේ දී උද්ධමනය පහළ මට්ටමක පවතිනු ඇතැයි පුරෝකථනය කෙරේ.

විදේශීය අංශයෙන් ගත්කල, 2014 මාර්තු මාසයේ දී වාර්තා වූ ඉහළ අපනයන වෙළෙඳ පරිමාවන් හේතුවෙන් 2014 පළමු කාර්තුවේ දී වෙළෙඳ හිඟය සියයට 12 කින් පමණ අඩු විය. 2014 මාර්තු මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 28.6 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කරමින්, අපනයන ඉපැයීම් එක්සත් ජනපද ඩොලර් බිලියනය ඉක්මවා ගියේය. තවදුරටත් දියුණු ආර්ථිකයන් යථාතත්ත්වයට පත්වීම ස්ථායීව පැවතීම හේතුවෙන් අපනයන ඉපැයීම් පිළිබඳ ඉදිරි අපේක්ෂාවන් හිතකර මට්ටමක පවතී. ආනයන වියදම

මාර්තු මාසයේ සුළු වශයෙන් ඉහළ යාමක් පෙන්නුම් කළේ අප්‍රේල් උත්සව සමය වෙනුවෙන් අතරමැදි භාණ්ඩ සහ පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළ යාම හේතුවෙනි. 2014 මාර්තු මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම්වල සැලකිය යුතු ඉහළ යාමක් වාර්තා වූ අතර 2014 අප්‍රේල් වනවිට සංචාරක පැමිණීම් 500,000 සීමාව ඉක්මවා යමින් වසරේ පළමු මාස හතර තුළ දී අඛණ්ඩව වර්ධනය විය. 2014 මාර්තු මස අවසානය වනවිට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් බිලියන 8.1 ක් වූ අතර එය ආනයනික මාස 5.5 කට සමාන වේ. 2014 අප්‍රේල් මස නිකුත් කරන ලද සත්වැනි ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයේ අරමුදල් ලැබීමත් සමග සංචිත මට්ටම තවදුරටත් ඉහළ යනු ඇත.

2014 වසර සඳහා පුරෝකථනය කරන ලද සාමාන්‍ය වර්ධනය වූ සියයට 14 දක්වා ළඟාවීමක් පෙන්නුම් කරමින් 2014 මාර්තු මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) සියයට 14.5 දක්වා අඩුවීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. බැංකු පද්ධතියෙහි ශුද්ධ විදේශීය වත්කම් රුපියල් බිලියන 24.8 කින් ඉහළ යාම මෙන්ම රජය වෙත ලබා දුන් ශුද්ධ ණය රුපියල් බිලියන 48.6 කින් සැලකියයුතු ලෙස ඉහළ යාම මාර්තු මාසයේ දී පුළුල් මුදල් සැපයුමෙහි වර්ධනයට ප්‍රධාන වශයෙන් දායක විය. රාජ්‍ය සංස්ථා විසින් බැංකු අංශය වෙත වූ ඔවුන්ගේ වගකීම් පියවීම තවදුරටත් සිදු කළ අතර වසරේ පළමු මාස තුන තුළ දී රාජ්‍ය සංස්ථා වෙත ලබා දුන් ණයෙහි සමස්ත අඩුවීම් රුපියල් බිලියන 35.1 ක් විය. 2014 මාර්තු මාසයේ දී පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය රුපියල් බිලියන 7.6 කින් පමණ ඉහළ ගියේය. දේශීය බැංකු ඒකක වලින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය රුපියල් බිලියන 15.8 කින් පමණ වර්ධනය වීමක් දක්නට ලැබුණු අතර ආයෝජන මණ්ඩලයට (BOI) අයත් සමාගම් විසින් අක්වෙරළ බැංකු ඒකක වෙත සිදු කරන ලද පියවීම් හේතුකොටගෙන සමස්ත ණය වර්ධනය අඩු විය. උකස් ණය අත්තිකාරම් ශීඝ්‍රයෙන් පහත බැසීම පෞද්ගලික අංශයේ ණය වර්ධනය තවදුරටත් අඩු මට්ටමක පැවතීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

ඉහත කරුණු සැලකිල්ලට ගනිමින්, මුදල් මණ්ඩලය 2014 මැයි මස 19 වැනි දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේ දී වර්තමාන මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය යෝග්‍ය වන බව මුදල් මණ්ඩලයේ මතය වූ අතර එබැවින් මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික වන නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය වර්තමානයේ පවතින සියයට 6.50 සහ සියයට 8.00 මට්ටමේ නොවෙනස්ව පවත්වා ගැනීමට තීරණය කරන ලදී. උකස් අත්තිකාරම් අඛණ්ඩවම පහළ යාම හේතුවෙන් ආර්ථිකයේ ඵලදායී අංශයන් මත වන අහිතකර බලපෑම අවම කිරීම සඳහා රජය වෙනුවෙන් උකස් අත්තිකාරම් මත ණය සහතික යෝජනා ක්‍රමයක් ක්‍රියාවට නැංවීමට මුදල් මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. එසේම, වාණිජ බැංකු විසින් ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයේ ප්‍රතිලාභ ණය ලබාගන්නන් වෙත තවදුරටත් ප්‍රමාදයකින් තොරව විතැන් වනු ඇතැයි මහ බැංකුව අපේක්ෂා කරයි.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය නිකුත් කරනු ලබන දිනය යථා කාලයේදී ප්‍රකාශයට පත් කරනු ඇත.